දුරකථන/தொலைபேசி/*Telephones* :
රෙජිස්ට්‍රාර් / பதிவாளர் / Registrar – 2435446
කාර්යාලය / அலுவலகம் / Office – 2328651, 2436958
ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No. – 2323688

**SC/P/133/2026**

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. – 519

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின் உயர் நீதிமன்றம்
THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

කොළඹ 12/ கொழும்பு 12/COLOMBO 12.

දිනය / திகதி / Date: 2026.09.17

**Registered Post**

Maithree Gunarathna – AAL.
No. 118,
Barnes Place,
Colombo 07.

Calling for Observation

I write to forward a copy of the Complaint with attached documents sent by Hon. Pasan Amarasena Judge – Magistrate dated 11.09.2026 to call for your observation by way of an affidavit along with the relevant documents if any. You are required to submit the original document within one (01) month from the date hereof. You are further required to submit a soft copy of your affidavit and any annexures thereto. The same may be forwarded via email to: scpetition2025@gmail.com.

Please mention your A-number, contact details, e-mail address and the Complaint Number **SC/P/133/2026** in your future correspondence.

**Deputy Registrar of the Supreme Court**

K.N.A. Seneviratne
Additional Magistrate
Deputy Registrar
Supreme Court
Colombo 12
Sri lanka

Copy :

1. Hon. Pasan Amarasena Judge – Magistrate.

Scanned with CamScanner

THE REGISTRY SUPREME COURT
11 SEP 2026
SRI LANKA

මගේ අංකය: SCR/PE/CC/1/2026.

Hon. DR/Actn
For A
P.R/SC
19/09/2026

රෙජිස්ට්‍රාර්තුමිය,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය,
කොළඹ 12.

**ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතාගේ බරපතල වෘත්තීය විශමාචාරයක් සම්බන්ධයෙන් සහ අධිකරණයට අපහාස කිරීමක් සම්බන්ධයෙන් දැනුම්දීම.**

මා 2026.05.04 දින සිට කොටුව මහේස්ත්‍රාත්වරයා ලෙසට රාජකාරි කරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසියේ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශයේ, මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා විසින් මෙම අධිකරණයේ පවරන ලද නඩු අංක FRT/MC/ PC/1036/26 දරන නඩුව මා ඉදිරිපිටදී 2026.09.09 දින කැඳවන ලදී. එම නඩුවේ සැකකරු ලෙසට ජයසිංහ මුදියන්සේලාගේ සුගීෂ්වර ලෙනින් බණ්ඩාර නැමැති අය 2026.06.18 දින අධිකරණයට ඉදිරිපත් කර මෙවන විට රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

**එම නඩුවේ සැකකරු ජනාධිපති වැය ශීර්ෂයේ මුදල් අවභාවිතා කිරීම හා සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම සම්බන්ධයෙන් 1982 අංක 12 දරණ පොදු දේපල විෂයෙහිලා ගැණෙන වැරදි පිලිබඳ පනතේ 5(1) වගන්තිය සහ ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386, 389, 400, 403 වගන්ති යටතේ දඩුවම් ලැබිය හැකි වරදවල් සිදු කර ඇති බවට දක්වමින් ස්ථානාධිපති මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන අංශය, මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශය විසින් මුල් තොරතුරු වාර්තාව 2026/06/16 දින ඉදිරිපත් කර ඇත.** 1982 අංක 12 දරණ පොදු දේපල පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව වටිනාකම රු.100,000/- ඉක්මවන වටිනාකමක් බවට සහකාර පොලිස් අධිකාරීවරයාගේ සහතිකයද ඉදිරිපත් කර ඇත.

1999 අංක 28 දරන පනතින් සංශෝධිත 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි සම්බන්ධ පනතේ 8 (1) වගන්තිය ප්‍රකාරව පොදු දේපල විෂයෙහිලා සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් වූ වටිනාකම රුපියල් 25,000/- ඉක්මවන අවස්ථාවකදී නඩු විභාගය අවසන් වන තෙක් සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කිරීම සිදු කළ යුතු වන බැවින් සහ ඇප ලබා දිය හැකිවන්නේ

Scanned with CamScanner

අසාමාන්‍ය කරුණු මත පමණක් වන බැවින්,මෙම නඩුවේ සැකකරු අධිකරණයට ඉදිරිපත් කරන ලද 2026.06.18 දින සිට මේ දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

01. <u>විවෘත අධිකරණයේ දී වෘත්තීය ආචාර ධර්ම වලට පටහැනිව ප්‍රකාශ සිදු කිරීම.</u>

මෙම නඩුව 2026.08.25 දින කැඳවූ අවස්ථාවේදී ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා විසින් මෙම සැකකරුට ඇප ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි. **එකී 2026.08.25 දිනැති සටහන් වල සහතික පිටපතක් 'A' ලෙසට සලකුණු කොට මේ සමඟ ඉදිරිපත් කර සිටිමි. ඉන් අනතුරුව මා විසින් එකී ඉල්ලීමට අදාළ නියෝගය 2026.09.09 දින විවෘත අධිකරණයේදී ප්‍රකාශයට පත් කරන ලදි. එකී නියෝගයේ සහතික පිටපතක් 'B' ලෙසට සලකුණු කොට මේ සමඟ ඉදිරිපත් කර සිටිමි.**

2026.09.09 දින මා විසින් විවෘත අධිකරණයේදී සවස 01.30 ට පමණ මෙම නඩුවේ නියෝගය ප්‍රකාශ කිරීමට කැඳවන ලද අතර, එකී නියෝගය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා විසින් නීතිඥවරයෙකුට නොගැලපෙන ආකාරයේ හැසිරීමක් විවෘත අධිකරණය තුළදී ප්‍රදර්ශනය කරන ලද බව දන්වා සිටිමි. නියෝගය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ඒ මහතා පහත සඳහන් ප්‍රකාශ කරන ලදි.

**"දැන් ඔබතුමා කොහොමත් ඇප දෙන්නේ නැහැ කියලා අපි දන්නවා......."**

මා විසින් නිශ්චිතව සැකකරුවෙකුට කිසිදු විටෙක ඇප ලබා නොදෙන බවට විවෘත අධිකරණයේදී ප්‍රකාශ කර සිටීම මඟින් මාද දැඩි අපහසුතාවයට ලක්වූ අතර, කිසිදු විටෙක උගත් ජනාධිපති නීතිඥවරයෙකුගෙන් මේ ආකාරයේ ප්‍රකාශයක් බලාපොරොත්තු විය නොහැක. මහජන අවධානය වැඩි වශයෙන් යොමු වී ඇති, සංවේදී නඩුවක නියෝගයක් ප්‍රකාශයට පත් කළ පසු මේ අයුරින් ජනාධිපති නීතිඥවරයෙකු ප්‍රකාශ කිරීම ඉතාම බරපතල තත්ත්වයකි.

ඉන් අනතුරුව එතුමා විවෘත අධිකරණයේදී මහේස්ත්‍රාත්වරයාට කරන ලද චෝදනාව සම්බන්ධයෙන් කරුණු වාර්තාගත කිරීමට අවශ්‍යද? යන්න සම්බන්ධයෙන් මා විමසා සිටි අතර, එවිට ඔහු විවෘත අධිකරණයේදී ප්‍රකාශ කර සිටියේ,

**"ඔබතුමාට ඕන නම් රෙකෝඩ් කරන්න, මට ප්‍රශ්නයක් නැහැ."**

Scanned with CamScanner

යනුවෙනි. තවදුරටත් ඒ මහතා විසින් සඳහන් කර සිටියේ,

**" මේක දැන් 23 එනවනේ, අපි එතකොට ඒක බලාගන්නම් ගරු උතුමාණනි."**

යනුවෙන් වේ. නැවත වතාවක් විවෘත අධිකරණයේදී තර්ජනාත්මක ස්වරයෙන් මා වෙත ඒ මහතා විසින් කියා සිටින ලද්දේ,

**"අපි ඒක බලා ගන්නම් මහාධිකරණයේ දී. අපි ඒක බලා ගන්නම්."** යනුවෙනි.

කිසිදු අයෙකුගේ පූර්ව නිගමනවලට මහේස්ත්‍රාත්වරයෙකු ලක් නොවිය යුතු බව මා විසින් ඔහුට දන්වා සිටින ලද අතර ඉන් අනතුරුව ඔහු ප්‍රකාශ කර සිටියේ,

**" පූර්ව නිගමනය ඒක ගැන මහේස්ත්‍රාත්වරයෙකු, කවුරුත් ලක් වෙන්න ඕනේ නැහැ කියන එක දන්නවා. ඒක හැබැයි ඉතින් ජනතාවත් ඒක තේරුම් අරගෙන තියෙනවා."** යනුවෙනි.

ඉහත ආකාරයෙන් නඩුවක නියෝගයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එම නියෝගය ලබා දුන් මහේස්ත්‍රාත්වරයා සම්බන්ධයෙන් විවෘත අධිකරණයේදී පූර්ව නිගමන වල පිහිටා ප්‍රසිද්ධියේ අසත්‍ය හා ද්වේෂ සහගත ප්‍රකාශ කිරීම නීතිඥ වෘත්තීය ආචාරධර්ම වලට පටහැනි බව පැහැදිලි කාරණයකි. **2026.09.09 දින විවෘත අධිකරණයේ රාජකාරි කරන ලද ලඝුලේඛිකාවගේ ශ්‍රව්‍ය පටිගත කිරීමේ යන්ත්‍රයෙහි මෙම නඩුවට අදාළව සිදු වූ සිද්ධිය පටිගත වී ඇති අතර එකී පටිගත කිරීම සංයුක්ත තැටි 02ක අන්තර්ගත කර "C" ලෙස සලකුණු කොට මේ සමඟ ඉදිරිපත් කර සිටිමි.**

මෙම නඩුවේ සැකකරු 2026/06/18 වන දින අධිකරණයට ඉදිරිපත් කරන ලද අවස්ථාවේ නීතිඥ ජීවන්ත ජයතිලක මහතා ඔහු වෙනුවෙන් ඇප ඉල්ලීමක් සිදු කළ අතර එකී ඇප ඉල්ලීම මා විසින් අසාමාන්‍ය කරුණු ඉදිරිපත් නොකිරීම මත ප්‍රතික්ෂේප කරන ලදී. ඉන් අනතුරුව 2026/07/01 දින ජනාධිපති නීතිඥ නලින්ද ඉන්දතිස්ස මහතා සැකකරු වෙනුවෙන් ඉල්ලීමක් සිදු කරන ලද අතර එකී ඉල්ලීම සම්බන්ධයෙන් ද 2026/07/08 දින මා නියෝගය ප්‍රකාශයට පත් කරන ලද අතර එකී නියෝගය මගින් නැවත වතාවක් අසාමාන්‍ය කරුණු ඉදිරිපත් නොකිරීම මත ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉන් අනතුරුව නැවත වතාවක් 2026/07/ 22 දින ජනාධිපති නීතිඥ නලින්ද ඉන්දතිස්ස මහතා සැකකරු වෙනුවෙන් ඇප ඉල්ලීමක් සිදු කරන ලද අතර ඊට අදාළ නියෝගය මා විසින් 2026/07/30 දින ප්‍රකාශයට පත් කරන ලද අතර එමගින් ද අසාමාන්‍ය කරුණු ඉදිරිපත් ඇප දීමට තරම් ප්‍රමාණවත් අසාමාන්‍ය කරුණු ඉදිරිපත් නොවීම මත ඇප

Scanned with CamScanner

ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. ඉන් අනතුරුව මෙම නඩුව අධිකරණ විවේක කාලයේදී 2026/08/12 දින කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය අතිරේක මහේස්ත්‍රාත් එම්. එල්. නුවන් කෞශල්‍ය මැතිතුමා ඉදිරියේදී කැඳවා ඇති අතර එදින සැකකරු වෙනුවෙන් ජනාධිපති නීතිඥ සංජය රාජරත්නම් මහතා ඇප ඉල්ලීමක් සිදු කර ඇත. එදින කොළඹ අතිරේක මහේස්ත්‍රාත් නුවන් කෞශල්‍ය මැතිතුමා විසින් ද ප්‍රමාණවත් සුවිශේෂී කරුණු ඉදිරිපත් නොවීම මත සැකකරු වෙනුවෙන් කරන ලද ඇප ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉන් අනතුරුව 2026.08.25 දින ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා විසින් ඉහත කී ඉල්ලීම සිදු කර ඇත.

ඒ අනුව මීට පෙර හතර වතාවක් උගත් ජනාධිපති නීතිඥවරුන් දෙදෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු සැකකරු වෙනුවෙන් ඇප ඉල්ලීම් සිදු කර ඇති අතර එකී ඇප ඉල්ලීම් ප්‍රතික්ෂේප වූ කිසිදු අවස්ථාවකදී අධිකරණයට හෝ මහේස්ත්‍රාත්වරයාට දෝෂාරෝපණය කිරීමක් මේ ආකාරයෙන් සිදු කර නොමැත. ඒ අනුව ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා ඉතාමත් ද්වේෂ සහගත ආකාරයෙන් අධිකරණය අපහසුතාවයට පත් කිරීමේ අරමුණින් යුතුව බරපතල වෘත්තීය විෂමාචාරයක, විවෘත අධිකරණයේදීම යෙදී ඇති බව ඉහත කරුණු අනුව සනාථ වේ.

එම අවස්ථාවේදී විවෘත අධිකරණයෙහි නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් මහේෂි ද සිල්වා, ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න ඇතුළු විශාල නීතිඥ පිරිසක් ද මහජනතාව විශාල පිරිසක් ද ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ද අධිකරණ කාර්ය මණ්ඩලය ද සිටි අතර එවැනි තත්ත්වයකදී මේ ආකාරයෙන් නීතිඥවරයෙකුට නොගැලපෙන ආකාරයේ ප්‍රකාශ කිරීම බරපතල වෘත්තීය විෂමාචාරයක් බව දන්වා සිටිමි. ඒ අනුව ඒ සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට යොමු කර වෘත්තීය විෂමාචාරය සම්බන්ධයෙන් නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතාට විරුද්ධව පියවර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

02. <u>අධිකරණයට අපහාස කිරීම.</u>

ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා විසින් විවෘත අධිකරණයේදී සිදු කරන ලද ප්‍රකාශ මගින් 2024 අංක 08 දරන අධිකරණයකට විනිශ්චයාධිකරණයකට හෝ ආයතනයකට අපහාස කිරීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකරණයට අපහාස කිරීමක් ද සිදුවී ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

1

Scanned with CamScanner

ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතාගේ ඉහත හැසිරීම මගින් 2024 අංක 08 දරන අධිකරණයකට විනිශ්චයාධිකරණයකට හෝ ආයතනයකට අපහාස කිරීමේ පනතේ, 03 (1)(අ)(ආ) වගන්තිවල දක්වා ඇති පරිදි,

- අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක අධිකාරී බලය සහ යුක්තිය පසිඳලීම අගෞරවයට හෝ අවතක්සේරුවට ලක් කිරීම සහ
- යම් විභාග වෙමින් පවතින නඩුවකට අදාළ අධිකරණ ක්‍රියාවලිය සඳහා මැදිහත් වීමේ හෝ ඊට තදබල අගතියක් සිදු කිරීමේ අදහසින් යුතුව එකී ක්‍රියාව සිදු කිරීම ද,

03 (2) (අ) වගන්තියෙහි දක්වා ඇති පරිදි

- අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක යම් නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට , විධානයකට, ආඥාවකට, රිට් ආඥාවකට හෝ වෙනත් කැඳවීම් නියෝගයකට චේතනාන්විතව ගරු නොකිරීම ද,

03(2)(ඇ)(i)(ii)(iii) වගන්ති අනුව,

- අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක අධිකරණමය බලය හෝ ගරුත්වය අවමානයට ලක් කරන හෝ අඩු කරන ක්‍රියාවක් කිරීම,
- යම් අධිකරණ කටයුත්තක නිසි ක්‍රියාවලියට තදබල ලෙස අගතිගාමී වන හෝ ඊට නීති විරෝධී ලෙස මැදිහත් වීම
- යුක්තිය පසිඳලීමේදී මැදිහත් වන හෝ බාධා කරන අන්දමේ යම් සාවද්‍ය කාරණයක් ප්‍රකාශ කිරීම, අදහසක් පළ කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම සිදු කර ඇති බවද පැහැදිලිව පෙනී යයි.

ඊට අමතරව, 2024 අංක 08 දරන අධිකරණයකට, විනිශ්චයාධිකරණයකට හෝ ආයතනයකට අපහාස කිරීමේ පනතේ 03(2)(ඉ)(i)(ii)(iii) වගන්තිවල දක්වා ඇති පරිදි,

- යථා පරිදි යුක්තිය පසිඳලීමේ දී මැදිහත් වීමේ සහ/හෝ
- අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් මහජනතාව තුළ අසතුටක් ඇති කිරීමේ සහ/ හෝ
- යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් මහජනතාව තුළ සැකයක් ඇති කිරීමේ අදහසින් යුතුව අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් හෝ විනිශ්චයකාරවරයෙකු හෝ **අධිකරණ නිලධරයෙකු අවමානයට ලක් කිරීමක්**

Scanned with CamScanner

ඉහත ක්‍රියා මගින් ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මහතා විසින් සිදු කර ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ජනාධිපති නීතිඥවරයෙකු විසින් විවෘත අධිකරණයේදී මේ ආකාරයෙන් අධිකරණයට අපහාස කිරීමක් සිදු කිරීම පිළිබඳව ඉතාම බරපතල ආකාරයෙන් සලකා බැලිය යුතු කාරණයක් වන බැවින් 2024 අංක 08 දරන අධිකරණයකට විනිශ්චයාධිකරණයකට හෝ ආයතනයකට අපහාස කිරීමේ පනතේ 11(i) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමකින් තොරව ඒ පිළිබඳව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානය යොමු කර සුදුසු පියවර ගැනීම සඳහා ඔබතුමිය වෙත දන්වා සිටිමි.

පසාන් අමරසේන,
මහෙස්ත්‍රාත්,
කොළඹ කොටුව.

පසාන් අමරසේන
මහේස්ත්‍රාත්
කොටුව

වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 11 වන දින

කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දීය.

Scanned with CamScanner